# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**2022 ඔක්තෝබර් මස 07 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2022.10.13 දින නිකුත් කරන ලදී)**


## ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණඥයින්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයන්ගේ පනත් කෙටුම්පතකි)

**ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණඥයින්ගේ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ගාමිණී වලේබොඩ මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිස යි


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිල : රු. 40.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණඥයින්ගේ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

"ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණඥයින්ගේ ආයතනය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන ආයතනයක්, එකී ආයතනයේ සාමාජිකයන්ගේ වෘත්තීය තත්ත්වය සහ විනය පරිපාලනය කිරීම, පාලනය කිරීම සහ පවත්වාගෙන යාමේ කාර්යය සඳහා සහ පොදුවේ ආයතනයේ පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීම සහ එහි සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව එකී ආයතනය හා සම්බන්ධ සියලු කාරණා ඉටු කිරීම සඳහා පිහිටුවනු ලැබූ හෙයින් ද:

එකී ආයතනය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, එම පරමාර්ථ සහ කරුණු මෙතෙක් සාර්ථක ලෙස සිදුකරනු ලැබ ඇති සහ ඉටුකරනු ලැබ ඇති හෙයින් ද, එකී ආයතනය සංස්ථාගත කිරීම සඳහා ඉල්ලුම් කරනු ලැබ ඇති හෙයින් ද, එකී ඉල්ලීම ප්‍රදානය කිරීම මහජනතාවගේ යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

1. මේ පනත 2022 අංක         දරන ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණඥයින්ගේ ආයතනය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණඥයින්ගේ ආයතනය සංස්ථාගත කිරීම

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසුව මෙයින් සංස්ථාපනය කරනු ලබන සහ සංස්ථාගත කරනු ලබන (මෙහි මින්මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණඥයින්ගේ ආයතනයේ දැනට සාමාජිකයන් වන හෝ මින්මතු ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණඥයින්ගේ ආයතනයේ සාමාජිකයන් ලෙස ඇතුළත් කරගනු ලබන යම් තැනැත්තන් (ඔවුන් සාමාජිකයන්ව සිටින තාක්) මෙම සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් විය යුතු අතර (මෙහි මින්මතු "සංස්ථාපිත මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණඥයින්ගේ ආයතනය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර එකී නාමයෙන් එය විසින් ද, එයට විරුද්ධව ද, සියලු අධිකරණවල දී සහ සියලු ආකාරයේ නඩුකර සහ සිවිල් නඩු කටයුතුවල දී, නඩු පැවරීම හෝ නඩු පවරනු ලැබීම කරනු ලැබිය හැකි ය. යම් මුද්‍රාවක් තබා ගනිමින් එය භාවිත කිරීම සඳහා සහ ස්වකීය අභිමතය පරිදි කලින් කලට එය වෙනස් කිරීම, ඉවත්කර අලුත් කිරීම සඳහා වන පූර්ණ බලය

සහ අධිකාරය සහ සංස්ථාපිත මණ්ඩලයකට ආනුශංගික වන හෝ අයත් අනෙකුත් සියලු ක්‍රියාවන් සිදුකිරීම සඳහා වන බලය සංස්ථාපිත මණ්ඩලය සතු විය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ

**3.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක සඳහන් විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලය සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:-

(අ) සැලසුම් තාක්ෂණවේදයේ ශිල්ප ක්‍රම සහ කුසලතා ඇතුළුව එහි දියුණුව ප්‍රවර්ධනය කිරීම සහ සුපෝෂණය කිරීම;

(ආ) (මෙහි මින්මතු "ටීවීඊසී පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) සංශෝධිත 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තිය අධ්‍යාපන පනතේ සඳහන් විධිවිධානවලට යටත්ව, සැලසුම් තාක්ෂණවේදය වෘත්තියෙහි ඒකමතිකභාවය ආරක්ෂා කිරීම සහ (මෙහි මින්මතු "ටීවීඊසී" යනුවෙන් සඳහන් කරනු ලබන) ටීවීඊසී පනත යටතේ පිහිටුවන ලද තෘතීයික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විමසා ශ්‍රී ලංකාවේ සැලසුම් තාක්ෂණවේද අධ්‍යාපනය නවීකරණය කිරීම, අධීක්ෂණය කිරීම, ඒ සඳහා උපදේශනය ලබාදීම සහ පාලනය කිරීම.

(ඇ) ටීවීඊසී. පනතේ විධිවිධානවලට යටත්ව,සැලසුම් තාක්ෂණවේදයට අදාළව ටීවීඊසී විසින් ප්‍රතීතනය කරන ලද යම් පාඨමාලා පැවැත්වීම සඳහා ටීවීඊසී විසින් සංස්ථාපිත මණ්ඩලය වෙත ලබා දෙන ලද යම් අධිකාරී බලයක් සංස්ථාපිත මණ්ඩලය විසින් කිසිඳු අවස්ථාවක දී ඉක්මවනු නොලබන පරිදි සැලසුම් තාක්ෂණවේද පාඨමාලා පැවැත්වීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඈ) සැලසුම් තාක්ෂණවේද වෘත්තියට සහ එය පුහුණු කිරීමට අදාළව අවශ්‍ය වන ආකාරයේ යම් නීතියේ කොටස් අධ්‍යයනය කිරීම ප්‍රවර්ධනය කිරීම;

(ඉ) පහත සඳහන් එහෙත් ඒවාට සීමා නොවන්නාවූ ක්‍රමවේද මගින් සැළසුම් තාක්ෂණවේදයේ ශිල්ප ක්‍රම සහ කුසලතා ඇතුළුව සැලසුම් තාක්ෂණවේදයට අදාළ හෝ ඊට

සම්බන්ධිත දැනුම ලබා ගැනීම, දැනුම ව්‍යාප්ත කිරීම සහ හුවමාරු කිරීම ප්‍රවර්ධනය කිරීම; එනම්:-

(i) ප්‍රශ්න පත්‍ර ඉදිරිපත් කිරීම සඳහා සහ ඒ පිළිබඳව සාකච්ඡා පැවැත්වීම සඳහා සංසදයක් සැපයීම;

(ii) පුස්තකාල පිහිටුවීම සහ පවත්වාගෙන යාම;

(iii) සැලසුම් තාක්ෂණඥයන් සඳහා සහ/හෝ මහජන යහපත සඳහා වැදගත් කරුණු පල කිරීම;

(ඊ) පනතේ ආ උපලේඛනයට යටත්ව සහ 6 වන වගන්තිය යටතේ නියම කරන ලද රීති සමග කියවෙන පරිදි සංස්ථාපිත මණ්ඩලයට අලුත් සාමාජිකයන් බඳවා ගැනීම සඳහා ඇතුළත්කර ගැනීමේ පරීක්ෂණයක් පැවැත්වීම හෝ පැවැත්වීම සඳහා කටයුතු සැලසීම සහ සම්පත් දායකයන් සහ විභාග පරීක්ෂකවරු යොදවාගෙන ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම;

(උ) ටීවීඊසී. පනතේ විධිවිධානවලට යටත්ව ටීවීඊසී හි ප්‍රතීතනය සමග සංස්ථාපිත මණ්ඩලය විසින් සපයනු ලබන අධ්‍යයන පාඨමාලා හදාරනු ලැබ ඇති තැනැත්තන් වෙත සහතික පත්‍ර සහ අනෙකුත් විශිෂ්ඨ සාමාර්ථ්‍යයන් ප්‍රදානය කිරීම;

(ඌ) ප්‍රදර්ශන පවත්වා කැපී පෙනෙන දක්ෂතා සහ/හෝ ජයග්‍රහණයන් සඳහා සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් වෙත පදක්කම් සහ/හෝ අනෙකුත් ත්‍යාග ප්‍රදානය කිරීම;

(එ) 6 වන වගන්තිය යටතේ එක් එක් අවස්ථා සඳහා නියම කර ඇති යම් රීති ප්‍රකාරව සංස්ථාපිත මණ්ඩලයේ විවිධ සාමාජික ශ්‍රේණි තීරණය කිරීම සහ සංස්ථාපිත මණ්ඩලයේ එකී සාමාජික ශ්‍රේණිවලට ප්‍රවේශවීම සඳහා අපේක්ෂකයින්ගේ සුදුසුකම් තක්සේරු කිරීම;

(ඒ) වෘත්තියේ තත්ත්වයන් (මෙහි මින්මතු "සීඩා" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකි (තත්ත්වයක් පවතී නම්) උසස් තත්ත්වයන්ට අනනුකූල නොවන පරිදි වෘත්තියේ තත්ත්වයන් පවත්වාගෙන යන බවට සහතික

කිරීම සඳහා සැලසුම් තාක්ෂණඥයින් ලෙස වෘත්තියෙහි නියුතු වන සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ගේ සාමාන්‍ය කටයුතු, විනය සහ වෘත්තියමය කටයුතු නියාමනය කිරීම;

(ඔ) ශ්‍රී ලංකාවේ සැලසුම් තාක්ෂණඥයින් ලෙස වෘත්තියෙහි නියුතු වන සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ගේ සහ සැලසුම් තාක්ෂණවේද වෘත්තිය හා සම්බන්ධ පොදු මහජනතාවගේ යහපත, සුභ සාධනය, අයිතිවාසිකම් සහ වරප්‍රසාද ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම;

(ඕ) සැලසුම් තාක්ෂණවේදයට අදාළ ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පවතින සංවිධාන සමඟ සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම;

(ක) රජය සහ එහි නියෝජිත ආයතන ඇතුලු තුන්වන පාර්ශ්ව සමග සන්නිවේදනය කිරීම සහ සැලසුම් තාක්ෂණවේද වෘත්තිකයන්ට අදාළ කරුණු පිළිබඳව සාමාජිකයන්ගේ අදහස් නියෝජනය කිරීම;

(ග) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ගේ සාමාන්‍ය කටයුතු, විනය සහ වෘත්තීයමය කටයුතුවලට අදාළව 6 වන වගන්තිය යටතේ නියම කරන ලද යම් රීති උල්ලංඝනය කිරීමෙන් පැන නගින ආරවුල් තීරණය කිරීම සහ/හෝ නිශ්චය කිරීම සහ සංස්ථාපිත මණ්ඩලයේ එකී නියම කරන ලද රීති ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම;

(ච) ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි සැලසුම් තාක්ෂණඥයින් ලෙස වෘත්තියෙහි නියුතු වන තැනැත්තන්ගේ ප්‍රයෝජනය හෝ අභිවෘද්ධිය සඳහා අවශ්‍ය විය හැකි දත්ත බැංකු පිහිටුවා පවත්වාගෙන යාම ඇතුළුව වෙනත් යම් පියවර ගැනීම;

(ජ) සාමාජිකයන් සඳහා ඇගයීම් යෝජනා ක්‍රමයක් නිශ්චය කිරීම සහ අඛණ්ඩ වෘත්තීයමය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම;

(ට) ඉහත සඳහන් පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් ඉටු කර ගැනීම සඳහා ආනුෂංගික හෝ උපකාර වන වෙනත් සියලු ක්‍රියා හෝ දේවල් කිරීම.

සංස්ථාපිත මණ්ඩලයේ බලතල

**4.** මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන බලතල ද ඇතුළුව, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම සඳහා හෝ වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන සියලු නිශ්චිත ක්‍රියාවන් සහ කරුණු කිරීම, ඉටුකිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන බලය සංස්ථාපිත මණ්ඩලයට තිබිය යුතු යː-

(අ) බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ වසාදැමීම;

(ආ) ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම සහ රැස්කිරීම සහ ප්‍රදාන සහ පරිත්‍යාග ලබා ගැනීම හෝ එකතු කිරීම;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්යය සඳහා වහා අවශ්‍ය නොවන සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල් සංස්ථාපිත මණ්ඩලය විසින් සුදුසු යයි සලකනු ලැබිය හැකි යම් ආකාරයකින් ආයෝජනය කිරීම;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව සුදුසුයයි සලකනු ලැබිය හැකි අයුරින් යම් චංචල හෝ නිශ්චල දේපළක් මිලදී ගැනීම මගින්, ත්‍යාගය, රික්තවරණය, හුවමාරු කිරීම මගින් හෝ වෙනත් යම් ආකාරයකින් අත්කර ගැනීම සහ දැරීම සහ සංස්ථාපිත මණ්ඩලය විසින් අත් කරගනු ලබන හෝ දරනු ලබන එවැනි යම් දේපළක් බද්දට හෝ උකසට ලබා ගැනීම හෝ ලබා දීම, විකිණීම, ප්‍රදානය කිරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයෙන් බැහැර කිරීම හෝ ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම;

(ඉ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සකස් කිරීම, පිළිගැනීම, පිටසන් කිරීම, ගනුදෙනු කිරීම, මිලදී ගැනීම, විකිණීම සහ නිකුත් කිරීම;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්යය සඳහා අවශ්‍ය වන යම් දෙයක් ඉදිකිරීම, මිලදී ගැනීම, පවත්වාගෙන යාම සහ අලුත්වැඩියා කිරීම;

(උ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන සේවකයන් පත්කිරීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් පහකිරීම සහ සංස්ථාපිත මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් පාරිශ්‍රමිකයක් ඔවුනට ගෙවීම සහ සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් විශ්‍රාම යාමේදී ඔවුන්ට සහ එම නිලධරයන් සහ සේවකයන්ගේ වැන්දඹුවන්ට සහ අනාථවූවන්ට කරුණා සහගත ගෙවීම් සහ පාරිතෝෂික ගෙවීම් ලබාදීම;

(ඌ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා හෝ එහි බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි සෘජුව හෝ සංස්ථාපිත මණ්ඩලය විසින් ඒ සම්බන්ධයෙන් බලය පවරන ලද නිලධරයකු හෝ අනුයෝජිතයකු මාර්ගයෙන් සියලු කොන්ත්‍රාත්තු හෝ ගිවිසුම්වලට ඇතුළත් වීම, ක්‍රියාත්මක කිරීම හෝ ඒවා පවත්වාගෙන යාම;

(එ) සංස්ථාපිත මණ්ඩලයේ යම් සාමාජිකත්ව ශ්‍රේණියකට ඇතුළත්වීම සම්බන්ධයෙන් සහ එකී සාමාජිකත්වය අලුත් කිරීම සඳහා වන ගාස්තු, සාමාජික මුදල් සහ දායක මුදල් අයකර ගැනීම;

(ඒ) ටීවීර්සී විසින් ප්‍රතීතනය කරන ලද සංස්ථාපිත මණ්ඩලය විසින් පවත්වනු ලබන පාඨමාලා සඳහා ගාස්තු, සාමාජික මුදල් සහ දායක මුදල් අයකර ගැනීම;

(ඔ) විධායක කමිටුව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි සංස්ථාපිත මණ්ඩලයේ යම් කර්තව්‍යයක් කරගෙන යාම සඳහා අවශ්‍ය වන පරිදි සහ අවශ්‍ය වන අවස්ථාවල දී උපකමිටු, උපදේශක කමිටු හෝ වෙනත් යම් කමිටුවක් පත්කිරීම;

(ඕ) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ගේ සාමාන්‍ය කටයුතු, විනය සහ වෘත්තීයමය කටයුතුවලට අදාළව 6 වන

වගන්තිය යටතේ නියම කරනු ලබන යම් රීති උල්ලංඝනය කිරීම හේතුවෙන් සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම;

(ක) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හෝ විදේශයන් හි වෙනත් තැනැත්තන්, නියෝජිත ආයතන සහ සංවිධාන සමඟ සහයෝගීතාව පවත්වා ගැනීම, ඒවාට උපකාර කිරීම, ඒවායින් උපකාර ලබාගැනීම සහ ඒවා සමඟ සම්බන්ධතා වර්ධනය කරගැනීම;

(ග) සැලසුම් තාක්ෂණවේද විද්‍යාවට අදාළ හෝ ඒ හා සම්බන්ධිත තොරතුරු හා දැනුම ව්‍යාප්ත කිරීම සඳහා සඟරා, විෂය සංග්‍රහයන්, ග්‍රන්ථ සහ වෙනත් ලේඛන ප්‍රකාශයට පත්කිරීම;

(ච) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ක්‍රියාවට නැංවීමේ දී, එහි සේවා නියුක්තිකයන්ට පාරිශ්‍රමික ගෙවීමේ දී සහ එහි බලතල සහ කාර්යයන් ඉටුකිරීමේ දී, දරනු ලබන සියලු වියදම් පියවීම සඳහා සංස්ථාපිත මණ්ඩලයේ මුදල් භාවිත කිරීම;

(ජ) පොදුවේ සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා මේ පනත මගින් සහ ඒ යටතේ සාදනු ලබන රීති මගින් බලය පවරා ඇති වෙනත් සියලු ක්‍රියා සහ දේවල් සිදුකිරීම.

සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු සහ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකත්වය කළමනාකරණය කිරීම

**5.** (1) මේ පනතේ විධිවිධානවලට සහ මේ පනතේ 6 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම විධායක කමිටුව විසින් පරිපාලනය කරනු ලැබිය යුතුය.

(2) (අ) සංස්ථාමය සාමාජිකයන්, සංස්ථාමය නොවන සාමාජිකයන් සහ අනුබද්ධිත සාමාජිකයන්ගෙන් සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් සමන්විත වේ;

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් ශ්‍රේණිගත කිරීම මෙහි "අ" වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරනු

ලබන ආකාරයෙන් විය යුතු අතර 6 වන වගන්තිය යටතේ නියම කරනු ලබන යම් රීති ප්‍රකාරව සංශෝධනය, එකතු කිරීම, ප්‍රතියෝජනය හෝ ඉවත් කිරීම කරනු ලැබිය හැකි ය.

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ යම් ශ්‍රේණියකට ඇතුළත් කරනු ලබන සාමාජිකයන්ගේ සුදුසුකම් මෙහි "ආ" වන උපලේඛනයේ නිශ්චිතව දක්වනු ලබන පරිදි විය යුතු අතර 6 වන වගන්තිය යටතේ නියම කරනු ලබන යම් රීති ප්‍රකාරව සංශෝධනය, එකතු කිරීම, ප්‍රතියෝජනය හෝ ඉවත් කිරීම කරනු ලැබිය හැකි ය.

(ඈ) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ආයතනයේ සාමාජිකයන්ව සිටි සහ මෙහි "ආ" වන උපලේඛනයේ නියම කරනු ලබන පරිදි සැලසුම් තාක්ෂණවේද වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකමක් ලබා ඇති සියලු තැනැත්තන් මේ පනතේ විධිවිධාන සහ 6 වන වගන්තිය යටතේ නියම කරනු ලබන යම් රීති යටතේ සියලු කාර්ය සඳහා අවස්ථාවෝචිත පරිදි සංස්ථාපිත මණ්ඩලයේ සමාන ශ්‍රේණියේ සංස්ථාමය සාමාජිකයන් හෝ සංස්ථාමය නොවන සාමාජිකයන් විය යුතු මෙන්ම එසේ සලකනු ලැබිය යුතු අතර අඛණ්ඩව එසේ විය යුතු ය.

(ඉ) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ආයතනයේ සාමාජිකයන්ව සිටි නමුත් මෙහි "ආ" වන උපලේඛනයේ නියම කරනු ලබන පරිදි සැලසුම් තාක්ෂණවේද වෘත්තියට අදාළව ජාතික වෘත්තීය සුදුසුකමක් ලබා නොමැති සියලු තැනැත්තන් මේ පනතේ විධිවිධාන සහ 6 වන වගන්තිය යටතේ නියම කරනු ලබන යම් රීති යටතේ සියලු කාර්යයන් සඳහා අවස්ථාවෝචිත පරිදි සංස්ථාපිත මණ්ඩලයේ සමාන ශ්‍රේණියේ අනුබද්ධිත සාමාජිකයන් විය යුතු මෙන්ම එසේ සලකනු ලැබිය යුතු අතර අඛණ්ඩව එසේ විය යුතු ය.

(ඊ) මෙහි "ආ" වන උපලේඛනයේ නියම කරනු ලබන පරිදි අදාළ ජාතික වෘත්තීය සුදුසුකම ලබාගන්නා සංස්ථාපිත මණ්ඩලයේ අනුබද්ධිත සාමාජිකයන් මේ

පනත ආරම්භ වීමෙන් පසු ඕනෑම අවස්ථාවක දී ඉල්ලීමක් මත අවස්ථාවෝචිත පරිදි සංස්ථාමය සාමාජිකයන් හෝ සංස්ථාමය නොවන සාමාජිකයන් වශයෙන් නැවත ලියාපදිංචි විය යුතු ය.

(3) (අ) ධුර දරන්නන් විධායක කමිටුවේ ඡන්දයට පෙරාතුවම වූ අවුරුදු දෙක සඳහා සාමාජිකත්වය පවත්වාගෙන ගොස් ඇති සහ විධායක කමිටුවේ කොටසක් ව සිට ඇති ආයතනික සාමාජිකයන් සහ (අනුබද්ධිත ආශ්‍රිත සාමාජිකයන් සහ අනුබද්ධිත ආධුනික සාමාජිකයන් හැර) අනුබද්ධිත සාමාජිකයන් අතරින් තෝරා පත්කර ගනු ලැබිය යුතු ය;

(ආ) විධායක කමිටුවේ ධුර දරන්නන්ගේ තනතුරු සඳහා ලද නාම යෝජනා පත්‍ර විධායක කමිටුව විසින් පත්කරන ලද උප කමිටුවක් විසින් වාර්ෂික මහා සභා රැස්වීමේ දී යෝජනා කරනු ලැබිය යුතු අතර සංස්ථාපිත මණ්ඩලයේ විධායක කමිටුවේ කිසිදු ධුර දරන්නකු එක් වාරයක් (01) තුළදී අවුරුදු (3) තුනකට වඩා වැඩි කාලසීමාවක් සඳහා ධුර දරනු නොලැබිය යුතු ය.

(ඇ) විධායක සභාව පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු අතර විධායක කමිටුව සාමාජිකයන් දහතුනකට නොඅඩු සහ විසිහතකට නොවැඩි සාමාජිකයන් ගණනකින් සමන්විත විය යුතු ය.

(i) සංස්ථාපිත මණ්ඩලයේ ධුර දරන්නන් විය යුතු සියලු ගරු සභාපතිවරයා, ගරු උපසභාපතිවරු තිදෙනා, ගරු මහලේකම්වරයා, ගරු උපලේකම්වරයා, ගරු භාණ්ඩාගාරිකවරයා සහ ගරු උප භාණ්ඩාගාරිකවරයා;

(ii) හිටපු සභාපතිවරු;

(iii) 6 වන වගන්තිය යටතේ වන රීති මගින් නියම කරනු ලැබිය හැකි ආකාරයකින් ආයතනික සාමාජිකයන් සහ (අනුබද්ධිත ආශ්‍රිත සාමාජිකයන් සහ අනුබද්ධිත ආධුනික සාමාජිකයන් හැර) අනුබද්ධිත සාමාජිකයන්

අතරින් තෝරා ගනු ලැබිය යුතු විධායක කමිටුවේ වෙනත් යම් සාමාජිකයන්;

(iv) පහත දැක්වෙන එක් එක් ආයතනික නොවන සාමාජිකයන්, එනම් ආශ්‍රිත සාමාජිකයන්, ආධුනික සාමාජිකයන් සහ ශිෂ්‍ය සාමාජිකයන් අතරින් විධායක කමිටුවේ දී තෝරා පත්කරගනු ලැබිය යුතු ඡන්ද අයිතිවාසිකම් නොමැති නිරීක්ෂකයන් වශයෙන්වූ සාමාජිකයන් තිදෙනකු;

(4) (අ) මේ පනත ආරම්භ වන දිනට පෙරාතුවම වූ දිනයේ දී ධුර දරනු ලබන ආයතනයේ විධායක කමිටුව 6 වන වගන්තිය යටතේ සාදන ලද රීති මගින් විධිවිධාන සලස්වනු ලබන ආකාරයෙන් පළමුවන විධායක කමිටුව තෝරා පත්කර ගනු ලබන තුරු සංස්ථාපිත මණ්ඩලයේ විධායක කමිටුව ලෙස කටයුතු කරනු ලැබිය යුතු ය;

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ පළමුවන විධායක කමිටුව මේ පනත ආරම්භ වන දින සිට වසරක් ඇතුළත තෝරාපත් කරගනු ලැබිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ රීති

**6.** (1) සංස්ථාපිත මණ්ඩලය විසින් කලින් කල සංස්ථාපිත මණ්ඩලයේ මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය ලබා දෙන ආයතනික සාමාජිකයන් සහ (අනුබද්ධිත ආශ්‍රිත සාමාජිකයන් සහ අනුබද්ධිත ආධුනික සාමාජිකයන් හැර) අනුබද්ධිත සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන කාරණා සඳහා මේ පනතේ විධිවිධානවලට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල විය යුතුය:-

(අ) සාමාජිකත්වය ශ්‍රේණිගත කිරීම සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවනු ලැබිය යුතු ගාස්තු;

(ආ) ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම, ධුර දරන්නන් ඉල්ලා අස්වීම, ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, ක්‍රියාකලාපය සහ කාර්ය;

(ඇ) විධායක කමිටුවේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම සහ එහි බලතල, ක්‍රියාකලාපය සහ කාර්ය සහ සාමාජිකයන්ගේ ධුර කාලය;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, ක්‍රියාකලාපය, කාර්ය සහ කර්තව්‍ය;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ වාර්ෂික මහා සභා රැස්වීම, වෙනත් මහා සභා රැස්වීම්, විශේෂ මහා සභා රැස්වීම් සහ විධායක කමිටුවේ රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම්වල වේලාව, ස්ථානය, දැන්වීම් සහ න්‍යාය පත්‍රය, ගණපූරණය සහ එම රැස්වීම්වල සිදුකරනු ලබන කටයුතු;

(ඊ) විධායක කමිටුවේ සාමාජිකයන්ගේ සහ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ගේ සුදුසුකම් සහ නුසුදුසුකම්;

(උ) සංස්ථාපිත මණ්ඩලයේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල්වල භාරකාරත්වය සහ එහි ගිණුම් පවත්වාගෙන යාම හා ගිණුම් විගණනය කිරීම;

(ඌ) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ගේ සාමාන්‍ය කටයුතු, විනය සහ වෘත්තීයමය කටයුතුවලට අදාළ තත්ත්වයන්;

(එ) පැමිණිලි කිරීමේ ආකෘතිය, විනය කමිටු පත්කිරීම සහ එයට නෛතික සහය ලබාදීම, චෝදනා ගොනුකිරීම, පිළිතුරු ලෙස පැහැදිලි කිරීම් සැපයීම, නිවේදන නිකුත් කිරීම, නෛතික නියෝජනය සඳහා පාර්ශ්වයන් සතු අයිතිවාසිකම්, එයට අදාළ වන සාක්ෂි රීති සහ එහි නඩු කටයුතුවල වාර්තා පවත්වාගෙන යාම ඇතුළුව විනය පරීක්ෂණවල කාර්ය පටිපාටිය සහ විනය කමිටුවල වාර්තාවල ආකෘතිය සහ අන්තර්ගතය;

(ඒ) සැලසුම් තාක්ෂණවේදයට සහ ටීවීඊසී පනතේ විධිවිධානවලට අදාළව ටීවීඊසී විසින් ප්‍රතීතනය කරන ලද යම් පාඨමාලා පැවැත්වීම සඳහාලබාදී ඇති අධිකාරී

බලයට නිතරම රීති යටත්වන පරිදි සැලසුම් තාක්ෂණවේදය පිළිබඳ පාඨමාලා පැවැත්වීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඔ) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි හෝ පොදුවේ සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ ඉටු කිරීමට මෙන්ම එහි බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි මෙහි මීන් පෙර නිශ්චිතව සඳහන් කර නොමැති වෙනත් සියලු කරුණු;

(2) 5 (5) (ආ) වගන්තිය යටතේ සංස්ථාපිත මණ්ඩලයේ පළමු විධායක කමිටුව තෝරා පත්කර ගැනීමට පෙරාතුව, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දරන ලද ආයතනයේ විධායක කමිටුව විසින් පනතේ 6 වන වගන්තිය යටතේ රීති සාදනු ලැබිය හැකි නමුත්, මෙම සීමා සහිත අන්තර් කාලසීමාව තුළදී මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවමවූ දිනයේදී බලාත්මකව පැවති ආයතනයේ රීති, මේ පනතේ විධිවිධාන ප්‍රකාරව හෝ වෙනත් යම් ලිඛිත නීතියක් ප්‍රකාරව අනනුකූල නොවනතාක් දුරට මේ වගන්තිය යටතේ සාදන ලද රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) සාදනු ලබන සෑම රීතියක්ම (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන රීති ආකාරයෙන්ම සංශෝධනය කිරීම, වෙනස් කිරීම, එයට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකිය.

(4) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් සංස්ථාවේ තත්කාලයේ දී බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

**සංස්ථාපිත මණ්ඩලය විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව**

**7.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියෝදනයක් හෝ අන්‍යාකාරයකින් සංස්ථාපිත මණ්ඩලය සතුවන චංචල හා නිශ්චල දේපළ අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව නීතියෙන් සංස්ථාපිත මණ්ඩලයට හැකියාව සහ බලය ඇති අතර, එකී සියලු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ, ඒ සම්බන්ධ කටයුතු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, 6 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත්ව, පනතේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසින් එකී දේපල දරනු ලැබිය යුතු ය.

**සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල**

**8.** (1) සංස්ථාපිත මණ්ඩලයට එහි ම අරමුදලක් තිබිය යුතු අතර සංස්ථාපිත මණ්ඩලයවෙනුවෙන් ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, ප්‍රදාන, පරිත්‍යාග, දායක මුදල් හෝ ගාස්තු වශයෙන් මෙතෙක් කල් ලැබුණු හෝ මින්මතු ලැබෙන සියලු මුදල්, විධායක කමිටුව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාපිත මණ්ඩලයේ අරමුදලේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු නමුත් අරමුදලට ලැබෙන යම් විදේශ ප්‍රදාන හෝ ත්‍යාග මහාභාණ්ඩාගාරයේ බාහිර සම්පත් දෙපාර්තමේන්තුව හරහා සංස්ථාපිත මණ්ඩලයේ අරමුදලේ බැරට වෙන්කර එම අරමුදලේ බැරට තැන්පත් කරනු ලැබිය යුතුය.

(2) සංස්ථාපිත මණ්ඩලය පුනරුත්ථාපනය කිරීමේ, සංවර්ධනය කිරීමේ හෝ වැඩිදියුණු කිරීමේ කාර්ය සඳහා ක්ෂය අරමුදලක් හෝ නිදන් අරමුදලක් සංස්ථාපිත මණ්ඩලය විසින් පිහිටුවනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටුකිරීමේ දී සංස්ථාපිත මණ්ඩලය විසින් දරනු ලබන වියදම් පියවීම සඳහා අවශ්‍ය වන සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) සංස්ථාපිත මණ්ඩලයේ මුදල් වර්ෂය අප්‍රේල් මස 1 වන දින සිට ආරම්භව පසුව එළඹෙන වර්ෂයේ මාර්තු මස 31 වන දින දක්වා වූ කාලසීමාව විය යුතුය.

**සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවිය යුතු සහ සංස්ථාපිත මණ්ඩලයට අය විය යුතු ණය**

**9.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවමවූ දිනයේ දී ආයතන විසින් ගෙවිය යුතුව පැවති සියලු ණය සහ බැරකම් මෙයින් ස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවා නිදහස් කරනු ලැබිය යුතු අතර එදින ආයතනයට ගෙවිය යුතු සියලු සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා මේ පනත යටතේ සාදනු ලබන සංස්ථාපිත මණ්ඩලය වෙත ගෙවනු ලැබිය යුතු ය.

**සාමාජිකයන්ගේ බැරකම් සීමා කිරීම**

**10.** සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයකු සංස්ථාපිත මණ්ඩලයේ ණය සහ බැරකම් ගෙවා දැමීමේ කාර්ය සඳහා හෝ වෙනත් යම් කාර්යය සඳහා ඔහුගේ කැමැත්තෙන් තොරව, සාමාජික ගාස්තුව වශයෙන් එම සාමාජිකයාගෙන් අයවිය යුතු මුදල ඉක්මවමින් කිසිඳු දායක මුදලක් ගෙවීමට යටත් නොවිය යුතුය.

ගිණුම් සහ විගණනය

**11.** (1) සංස්ථාපිත මණ්ඩලය විසින් එහි ආදායම, වියදම සහ සංස්ථාපිත මණ්ඩලයේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම් සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්-

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවනලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට එම ආයතනයේ විධායක කමිටුව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නාවූ ද තැනැත්තකු; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු, ශ්‍රී ලංකා වරලත් ගණාකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නාවූ ද, එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට එම ආයතනයේ විධායක කමිටුව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නාවූ ද, එවැනි ගණකාධිකාරී සමාගමක්

අදහස් වේ.

ස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව

**12.** සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව ගරු ලේකම්වරයාගේ භාරයේ තබනු ලැබිය යුතු අතර විධායක කමිටුවේ අධිකාරී බලය කලින් ලබා ගැනීමකින් තොරව සහ විධායක කමිටුව විසින් නිසි ලෙස බලය පවරන ලද විධායක කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස කවර හෝ සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. තවද, ඔවුන් තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

නිල නාම හා පදවි නාම භාවිතය

**13.** (1) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ලියාපදිංචිව සිටින සංස්ථාපිත මණ්ඩලයේ සෑම සාහාධ්‍ය සාමාජිකයෙකුට ම හෝ අනුබද්ධිත සාහාධ්‍ය සාමාජිකයකුට ම ඔහු සාහාධ්‍ය

සාමාජිකයකු වන බවට පෙන්නුම් කිරීම සඳහා, ඔහුගේ නමට පසුව "FIDT (SL)" යන ලුහුඬු පදවි නාමය භාවිත කිරීමට අයිතියක් ඇත්තේ ය.

(2) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ලියාපදිංචිව සිටින සංස්ථාපිත මණ්ඩලයේ සෑම සාමාන්‍ය සාමාජිකයකුට ම හෝ අනුබද්ධිත සාමාන්‍ය සාමාජිකයකුට ම ඔහු සාමාජිකයකු වන බවට පෙන්නුම් කිරීම සඳහා, ඔහුගේ නමට පසුව "MIDT (SL)" යන ලුහුඬු පදවි නාමය භාවිත කිරීමට අයිතියක් තිබිය ඇත්තේ ය.

(3) ඉහතින්ම වූ (1) වන සහ (2) වන උපවගන්ති ප්‍රකාරව "FIDT (SL)" හෝ "MIDT (SL)" යන ලුහුඬු පදවි නාම භාවිත කිරීම සඳහා අයිතියක් ඇත්තාවූ සෑම සාමාජිකයකුට ම, සාමාජිකයාගේ වෘත්තියෙහි නියැලීමට අදාළව සහ සංස්ථාපිත මණ්ඩලයේ ලේඛනයේ හෝ සීඩා හි පෙන්නුම් කරනු ලබන පරිදි, අවස්ථාවෝචිත පරිදි, "ගොඩනැගිලි, සිවිල්, විදුලි, යාන්ත්‍රික සහ MEP" අතුරින් ඕනෑම එකක් සමග "සැලසුම් තාක්ෂණඥ" යන නිල නාමය ගැනීමට සහ භාවිත කිරීමට අයිතිය තිබිය යුතු නමුත් එම සාමාජිකයාගේ පිළිවෙලින්වූ හිමිකම් ලැබෙන ලුහුඬු පදවිනාමය භාවිතයක් නොමැති වීමේදී පදවි නාමය භාවිත කරනු ලැබිය නොහැකි වේ.

නිල නාම භාවිත කිරීම සඳහා වන සීමා කිරීම්

**14.** (1) අවස්ථාවෝචිත පරිදි, යම් තැනැත්තකු යම් ශ්‍රේණියක හෝ පන්තියක සාමාජිකයකු වශයෙන් තත්කාලයේදී බඳවා ගෙන සිට ඇති නම් මිස, 13 වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති එම ශ්‍රේණියට හෝ පන්තියට බඳවා ගන්නා ලද සාමාජිකයකුට පමණක් ලබා ගත හැකි හෝ භාවිත කරනු ලැබිය හැකි 13 වන වගන්තියේ සඳහන් කරනු ලබන යම් නිල නාමයක්, විස්තරයක් හෝ ලුහුඬු නාමයක් එම තැනැත්තා විසින් ලබා ගැනීම හෝ භාවිත කිරීම කරනු නොලැබිය යුතු ය.

(2) ඉහතින්ම වූ උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකුː-

(අ) මේ පනත යටතේ වරදකට වරදකරුවකු විය යුතු ය; සහ

(ආ) එම තැනැත්තා විසින් සැලසුම් තාක්ෂණඥයකු ලෙස සපයන ලද සේවාවන් සඳහා වන යම් ගාස්තු ආපසු අයකර ගැනීම සඳහා මේ වගන්තිය බලාත්මක වීම ආරම්භ වන දින සිට එක් වර්ෂයක් ඉකුත්වීමෙන් පසුව යම් අධිකරණයක නඩු කටයුත්තක් ගොනුකිරීමට හෝ පවත්වාගෙන යාමට හිමිකම් නොලැබිය යුතු ය.

සැලසුම් තාක්ෂණඥයා සහ සැලසුම් තාක්ෂණවේදය යන්නෙහි අර්ථය

**15.** (1) මෙම පනතේ කාර්යය සඳහා, යම් තැනැත්තකු ඔහු විසින් ම හෝ වෙනත් යම් තැනැත්තකු සමග හවුල්කාරත්වයෙන් යුතුව ලැබුණු හෝ ලැබීමට නියමිත ප්‍රතිෂ්ඨාවක් හෝ පාරිශ්‍රමිකයක් වශයෙන් එම තැනැත්තා විසින් -

(අ) ඔහු විසින් ම ගොඩනැගිලි, සිවිල්, විදුලි, යාන්ත්‍රික සහ MEP සටහන් සකස් කිරීමේ යෙදීම;

(ආ) සීඩා විසින් නියම කරනු ලැබිය හැකි පරිදි සැලසුම් තාක්ෂණඥයකු ලෙස වෘත්තියෙහි යෙදී සේවයක් සපයනු ලබන්නේ නම්, සංස්ථාපිත මණ්ඩලය විසින් හෝ සීඩා විසින් කලින්කල පල කිරීම සඳහා වන නවතම ලේඛනයේ ඔහුගේ නම සඳහන්ව තිබීම;

(ඇ) සැලසුම් තාක්ෂණඥයකු ලෙස වෘත්තියෙහි යෙදීමේ සේවයක් සංයුක්තවීම සඳහා සීඩා විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් සේවයක් සැපයීම;

සිදුකරනු ලබන්නේ නම්, එම තැනැත්තා සැලසුම් තාක්ෂණඥයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ කාර්ය සඳහා, මේ පනත යටතේ සහ ඒ යටතේ සාදන ලද රීති යටතේ විධිවිධාන සලස්වා ඇති සාමාජිකත්වය ශ්‍රේණිගත කිරීම සහ වර්ගීකරණය කිරීමට යටත්ව, පාඨමාලා පැවැත්වීම, ප්‍රතීතනය සහ ලියාපදිංචි කිරීම ආදිය සිදුකිරීමේදී මෙන් උචිත අවස්ථාවලදී සැලසුම් තාක්ෂණවේදය යන්නට වෙනත් යම් නීතියක් යටතේ පිළිගෙන ඇති සැලසුම් ශිල්පී/ සැලසුම්කරුවකුගේ වෘත්තියෙහි යෙදීම ඇතුළත්වන ලෙස ද අදහස් විය යුතු ය.

වැරදි

**16.** (1) මේ පනතේ 14 වන වගන්තියේ සඳහන් යම් විධිවිධානයක් පැහැර හරිනු ලබන හෝ එම විධිවිධානයට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වන සෑම තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසුව වරදකරු කිරීමෙන් පසුව මාස හයකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයකට හෝ රුපියල් පනස්දහසකට නොවැඩි දඩයකට හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ එම තැනැත්තා යටත් වන්නේ ය.

(2) මේ පනත යටතේ පුද්ගල මණ්ඩලයක් විසින් වරදක් සිදුකරනු ලබන අවස්ථාවක දී-

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාපිත මණ්ඩලයක්වන්නේ නම්, එම සංස්ථාපිත මණ්ඩලයේ සෑම සාමාජිකයකුම සහ නිලධරයකුම; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ආයතනයක් වේ නම්, එම ආයතනයේ සෑම හවුල්කරුවකුම;

ඒ වරදට වරදකරු වන්නේය:

එසේ වුව ද, එම සංස්ථාපිත මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ නිලධරයකු හෝ ඒ ආයතනයේ හවුල්කරුවකු ඔහුගේ දැනීමෙන් තොරව යම් වරදක් සිදුකළ බවට හෝ යම් වරදක් සිදුකිරීම වැළැක්වීමට අවශ්‍ය නිසි උද්යෝගයෙන් ඔහු ක්‍රියා කළ බවට ඔහු විසින් ඔප්පු කරනු ලබන්නේ නම් එවැනි කිසිදු තැනැත්තකු එවැනි වරදකට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

මුදල්, කොන්ත්‍රාත්, ගිවිසුම්, වත්කම් සහ දේපළ.

**17.** 9 වන වගන්තියේ සඳහන් විධිවිධානවලට යටත්ව, මේ පනත යටතේ සහ මේ පනතේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලයේ ආරම්භක ප්‍රාග්ධනය, මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවමවූ දිනයේ ආයතනයේ පවතින ප්‍රාග්ධන සංචිතය විය යුතු අතර මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවමවූ දිනයේදී පැවති ආයතනයේ සියලු කොන්ත්‍රාත්, ගිවිසුම්, වත්කම් සහ දේපළ, මේ පනත යටතේ සහ මේ පනතේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලයේ කොන්ත්‍රාත්, ගිවිසුම්, වත්කම් සහ දේපළ ලෙස සලකනු ලැබිය යුතුය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ

**18.** සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වී තිබුණහොත් ඒ දේපළසංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු නමුත්, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, එහි හෝ ඒවායේ රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් එහි හෝ ඔවුන්ගේ සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන, සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්

විසින් සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේ දී හෝ විසුරුවා හැරීමට පෙර තීරණය කරනු ලැබිය හැකි ය.

*ජනරජයේ සහ අන්‍යන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.*

**19.** මේ පනතේ සඳහන් හෝ ඒ යටතේ හිමිකම්පාන කරුණු හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාපිත මණ්ඩලයක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව*

**20.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## උපලේඛනය

### "අ" වන උපලේඛනය

සංස්ථාපිත මණ්ඩලයේ ආයතනික සාමාජිකයන්, ආයතනික නොවන සාමාජිකයන් සහ අනුබද්ධිත සාමාජිකයන් ශ්‍රේණිගත කිරීම පහත දැක්වෙන පරිදි විය යුතු යː-

(අ) සංස්ථාපිත මණ්ඩලයේ ආයතනික සාමාජිකයකු සාහාධ්‍ය සාමාජිකයකු ලෙස හෝ සාමාන්‍ය සාමාජිකයකු ලෙස ශ්‍රේණිගත කරනු ලැබිය යුතු ය;

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ අනුබද්ධිත සාමාජිකයකු අනුබද්ධිත සාහාධ්‍ය සාමාජිකයකු ලෙස හෝ අනුබද්ධිත සාමාන්‍ය සාමාජිකයකු ලෙස හෝ අනුබද්ධිත ආශ්‍රිත සාමාජිකයකු ලෙස හෝ අනුබද්ධිත ආධුනික සාමාජිකයකු ලෙස ශ්‍රේණිගත කරනු ලැබිය යුතු ය; සහ

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ ආයතනික නොවන සාමාජිකයකු ආශ්‍රිත සාමාජිකයකු ලෙස හෝ ආධුනික සාමාජිකයකු ලෙස හෝ ශිෂ්‍ය සාමාජිකයකු ලෙස ශ්‍රේණිගත කරනු ලැබිය යුතු ය;

### "ආ" වන උපලේඛනය

(1) යම් තැනැත්තකු සැලසුම් තාක්ෂණවේදය 5 වන මට්ටම ජාතික වෘත්තිය සුදුසුකම සහිත වන්නේ නම් සහ අවුරුදු 6 ක කාලයක් සඳහා විධායක කමිටුවේ අඛණ්ඩව සේවය කරනු ලැබ ඇති නම් එම තැනැත්තා සාහාධ්‍ය සාමාජිකයකු ලෙස බඳවා ගැනීම සඳහා සුදුසු විය යුතු ය.

(2) යම් තැනැත්තකු සැලසුම් තාක්ෂණවේදය 5 වන මට්ටම ජාතික වෘත්තිය සුදුසුකම සහිත වන්නේ නම් එම තැනැත්තා සාමාන්‍ය සාමාජිකයකු ලෙස බඳවා ගැනීම සඳහා සුදුසු විය යුතු ය.

(3) යම් තැනැත්තකු සැලසුම් නිර්මාණ ශිල්පී 4 වන මට්ටම ජාතික වෘත්තිය සුදුසුකම සහිත වන්නේ නම් එම තැනැත්තා ආශ්‍රිත සාමාජිකයකු ලෙස බඳවා ගැනීම සඳහා සුදුසු විය යුතු ය.

(4) යම් තැනැත්තකු සැලසුම් නිර්මාණ ශිල්පී 3 වන මට්ටම ජාතික වෘත්තිය සුදුසුකම සහිත වන්නේ නම් එම තැනැත්තා ආධුනික සාමාජිකයකු ලෙස බඳවා ගැනීම සඳහා සුදුසු විය යුතු ය.

(5) යම් තැනැත්තකු 2 වන මට්ටම ජාතික වෘත්තිය සුදුසුකම හෝ ඊට අඩු මට්ටමක ජාතික වෘත්තිය සුදුසුකම සහිත වන්නේ නම් එම තැනැත්තා ශිෂ්‍ය සාමාජිකයකු ලෙස බඳවා ගැනීම සඳහා සුදුසු විය යුතු ය.